Sinhalese | සිංහල

# අපගේ නේවාසිකයන් ආරක්ෂිතව සහ හොඳින් තබා ගැනීමට අපට උදව් කරන්න

**නේවාසිකයන්ගේ සෞඛ්‍යය අපගේ අග්‍ර ප්‍රමුඛතාවයයි.**

වසරේ සෑම දිනක ම, දවසේ පැය 24 පුරා ම අවශ්‍ය රැකවරණය සහ සහයෝගය ඔවුන්ට ලැබෙන බව සහතික කිරීමට අපි කැපවී සිටින්නෙමු.

## 1

## යමෙකු රාත්‍රියේ, හෝ සති අන්තයේ අසනීප වුවහොත් කුමක් සිදුවේද?



- කඩිනමින් උපකාර ලබා ගත හැකි බව තහවුරු කර ගැනීමට අපට බොහෝ විකල්ප පවතියි.
- අප සමඟ හෙදියක් සිටින අතර, වෛද්‍යවරුන්, අනෙකුත් හෙදියන්, ඖෂධවේදීන්, රෝහල් සහ ගිලන්රථ සේවාව වෙත අපට සෘජු සම්බන්ධතා තිබේ.
- වෛද්‍යවරයකු සත්කාර නිවාසයට යන තෙක් බලා සිටීම වෙනුවට, ක්ෂණික විශේෂඥ උපදෙස් ලබා ගැනීම සඳහා "ටෙලිහෙල්ත්" - දුරකථන සහ වීඩියෝ ඇමතුම් - භාවිතා කිරීමට අපට හැකිය.
- හදිසි ප්‍රතිකාර ඒකකය වෙත යෑම කරදරකාරී විය හැකි නිසා, වෛද්‍යවරුන් සහ හෙදියන් හැකිතාක් රෝගාතුර වුවන් සඳහා ඔවුන්ගේ කාමරවල ම සත්කාර කරනු ඇත.
- හදිසි ඇමතුම් අංකය ලෙස ඔබේ අංකය ලැයිස්තුගත කර ඇත්නම්, සැලකිලිමත් වීමට හේතුවක් තිබේ නම් අපි ඔබ අමතන්නෙමු.

phn NORTH WESTERN MELBOURNE
An Australian Government Initiative
Ambulance Victoria
Virtual Emergency Department

## 2

## ඔබට උපකාර කිරීම සඳහා කළ හැක්කේ මොනවාද?



- නේවාසිකයන්ගේ GP (වෛද්‍යවරයා) සහ අනෙකුත් සම්බන්ධතා යාවත්කාලීන බව සහතික කර ගැනීමට අප අමතන්න. අපට එක්ව වැඩ කරන වේලාවෙන් බැහැර සත්කාර සඳහා සැලැස්මක් සකස් කළ හැකිය.
- ඔබ සෞඛ්‍ය සේවාවක් සඳහා නේවාසිකයෙකු පිටතට ගෙන යන්නේ නම්, කරුණාකර ප්‍රතිකාර සාරාංශයක් ලබා ගෙන ඔබ ආපසු පැමිණෙන විට එය අප සමග බෙදා ගන්න.
- නේවාසිකයාට පූර්ව සත්කාර සැලැස්මක් තිබේ නම්, හෝ ඔවුන් වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් අයෙක් පත් කර ඇති නම්, එම විස්තර අප සතුව ඇති බව සහතික කර ගන්න.

## 3

## ඔබට තවත් කළ හැක්කේ මොනවාද?



- නේවාසිකයාගේ කැමැත්තට ගරු කරන බවට වග බලා ගැනීම සඳහා පූර්ව සත්කාර සැලැස්ම ගැන ඔවුන් සමග කතා කරන්න.
- අවශ්‍ය නම්, ඇටෝර්නි බලය පිහිටුවීම හෝ වෛද්‍ය ප්‍රතිකාර ගැන තීරණ ගන්නෙකු පත් කිරීම ගැන සාකච්ඡා කරන්න.
- ඔබේ නේවාසිකයාට හොඳම සර්වප්‍රකාර සත්කාර සැපයීමට අවශ්‍ය සියලුම තොරතුරු අප සතුව ඇති බව සහතික කර ගැනීමට අප සමඟ කතා කරන්න.
- ඔබට අලුත් විය හැකි ප්‍රතිකාර විකල්ප කිහිපයක් තිබේ. වික්ටෝරියානු අතථ්‍ය හදිසි අවස්ථා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය (**ved.vic.gov.au**) බැලීම සහ "නේවාසික ස්ථානගත සේවා" සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය (**health.vic.gov.au**) තුළින් සෙවීම සලකා බලන්න.